මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date.

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**Human Rights Commission of Sri Lanka**

## 2020 පාර්ලිමේන්තු මහ මැතිවරණයට තරඟකරන දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් වල අපේක්ෂකයින් වෙත කරන ආයාචනයයි

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් පිහිටුවා, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවට සිදුකරන ලද 19 වන ව්‍යාවස්ථා සංශෝධනය මගින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවට ඇතුළත් කර ඇත. ස්වධීන ජාතික ආයතනයක් වන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දිවයිනේ සිටින සියළුම පුද්ගලයින්ගේ මානව හිමිකම් සුරක්ෂිත වන මානව හිමිකම් සංස්කෘතියක් රට තුළ ඇති කිරීම සඳහා ක්‍රියාත්මක වේ.

2020.06.03 වන දින අංක 2178/25 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව මඟින් ප්‍රකාශයට පත්කරන ලද "ඡන්ද විමසීම් වලදී තරඟකරනු ලබන දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් වල අපේක්ෂකයින් ලෙස අනුගමනය කළ යුතු ආචාරධර්ම පද්ධතිය" පිළිබඳව විශේෂ අවධානයක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව යොමුකර ඇත.

මෙවර පාර්ලිමේන්තු මහ මැතිවරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව වඩාත් පුළුල් ලෙස වූ ආචාරධර්ම පද්ධතියක් ප්‍රකාශයට පත්කර ඇත. ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ලෙස අප , අපගේ ප්‍රසාදය පළ කරන අතර, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව එහි 'ආ. සාමාන්‍ය හැසිරීම 01.' කෙරෙහි විශේෂ අවධානයක් යොමුකරනු ලැබේ. ඒ අනුව,

> *"ශ්‍රී ලාංකිකයින් අදහන ආගම්, භාවිතා කරන භාෂාව, ඔවුන්ගේ වාර්ගිකත්වය, චාරිත්‍ර වාරිත්‍ර හා කුල ගෝත්‍ර ආදී වෙනස්කම් සම්බන්ධයෙන් යම් ජන කොට්ඨාශයක හෝ යම් පුද්ගලයින් පිරිසකගේ හෝ වෛරය හෝ නොඉවසන සුළුබව උග්‍රවන ආකාරයට හෝ හැසිරීමෙන් වැළකීම සහ එවැනි හැඟීම් ඇතිවන අයුරින් අදහස් හෝ කරුණු ප්‍රකාශ නොකිරීම"*
>
> මූලාශ්‍රය : 2020 ජූනි මස 03 වන බදාදා අංක 2178/25 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය

මෙමගින් ශ්‍රී ලංකා සමාජයේ පවතින සමාජමය වෙනස්කම් පදනම් කර යම් පාර්ශවයක් ඉලක්ක කර වෛරයක් නැතහොත් නොඉවසන සුළුබවක් ඇතිවන ආකාරයෙන් හැසිරීමෙන් සහ එවැනි හැඟීම් ඇතිවන ආකාරයෙන් අදහස් හා කරුණු දැක්වීමෙන් වළකින ලෙස දක්වා ඇත. සමාජමය වෙනස්කම් භේදයක් ලෙස ඉස්මතු නොකරගන්නා ලෙස මෙහිදී කරුණු ඉදිරිපත් කර ඇත.

තවදුරටත් මෙම ආචාරධර්ම පද්ධතිය පිළිබඳ විමසීමේ දී එහි 'ඊ. වෛරී ප්‍රකාශ හෝ ජාතික සමගියට එරෙහි ප්‍රකාශ 01.' කෙරෙහි ඔබගේ අවධානයක් යොමුකරවන්නෙමු. මෙම ආචාරධර්ම තුළ කාන්තාවන්, ආබාධ සහිත


ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் / Head Office: 14, ආර්. ඒ. ද. මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04. / 14, R.A.De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2505541/74
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
දුරකථන: 011 2505580/81/82
ලේකම්: 011-2505521
ක්ෂණික: 011-2505575
වෙබ් / இணையம்: www.hrcsl.lk

පුද්ගලයින්, වෙනස් වූ ලිංගික හැඩගැසීම් ඇති පුද්ගලයින් සහ වෙනත් ආගමික හෝ ජනවාර්ගික කණ්ඩායම් කෙරෙහි අවධානයක් යොමුකර ඇත. ඒ තුළ කරුණු කිහිපයක් කෙරෙහි විශේෂ කරුණු කිහිපයක් කෙරෙහි කේන්ද්‍ර අවධානය යොමු කර ඇත. එනම්;

01. ඉහත සඳහන් කළ සමාජයේ පවතින වෙනස්කම් පදනම්ව කිසියම් සමාජ හෝ ප්‍රජා කණ්ඩායම් බියගන්වන හෝ අපහාසයට ලක්කරන කවර හෝ ආකාරයේ වෛරී ප්‍රකාශ සිදුකිරීමෙන් වැළකිය යුතුය.
02. ජනවාර්ගික හා ආගමික කණ්ඩායම් අතර පවතින සුහදත්වය හා අන්නෝන්‍ය විශ්වාසය පළුදුවන ආකාරයේ කවර හෝ ප්‍රකාශ කිරීමෙන් වැළකිය යුතුය.
03. ජනවාර්ගික හා ආගමික කණ්ඩායම් වල සහ පුද්ගලයින්ගේ අභිමානය පළුදුවන හෝ හානිවන කටයුතු වලින් වැළකිය යුතුය.
04. ඉහත සඳහන් කල ශ්‍රී ලංකා සමාජයේ පවතින වෙනස්කම් පදනම් කරගනිමින් කවර හෝ තැනැත්තෙකුට හෝ කණ්ඩායමකට අගතිදායක හෝ වෙනස් කොට සලකනු ලබන බවට සැළකිය හැකි කටයුතු වලින් වැළකිය යුතුය.
05. කාන්තාවන්ට හෝ ආබාධ සහිත පුද්ගලයින්ට අවමන් සහගත හෝ අපවාදාත්මක කටයුතු වලින් වැළකිය යුතුය.

මෙම ආචාරධර්ම තුළ ශ්‍රී ලංකා සමාජයේ පවතින විවිධත්වයන් පදනම් කරගෙන සිදුකරනු ලබන ඉහත සඳහන් කරන ලද ක්‍රියාත්මක කිරීම් වලදී ඒ සිදුවන ආකාරයන් වඩාත් පුළුල් ලෙස දක්වා ඇත. එනම්, වෛරී ප්‍රකාශ නොකිරීම, රූප ප්‍රදර්ශනය කිරීමෙන් වැළකීම, ප්‍රකාශ ප්‍රචාරණ කටයුතු කිරීමෙන් වැළකීම සහ ඒවැනි ක්‍රියාවන් සිදුකිරීමෙන් වැළකීම ලෙස දැක්විය හැකිය.

මෙම ආචාරධර්ම පද්ධතිය තුළ අඩංගු ඉහත දක්වා ඇති කරුණු හුදෙක් මැතිවරණයක් ඉලක්ක කර පලවුවත්, එය අපගේ මූලික නීතිය වන ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ සංග්‍රහගතකර ඇත. එහි 12(2) වන ව්‍යවස්ථාව මගින් වර්ගය, ආගම, භාෂාව, කුලය, ලිංගිකත්වය, දේශපාලන මතය හෝ වෙනත් යම් හේතුවක් නිසා පුරවැසියන් වෙනස්කමකට භාජනය නොකළයුතු බව දක්වා ඇත. ඒ අනුව මෙම ආචාරධර්ම වලට අගෞරව කිරීම හුදෙක් ආචාරධර්ම කඩකිරීමක් පමණක් නොව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) වගන්තියට පටහැනි ආකාරයට ක්‍රියා කිරීමක් වෙයි.

එම නිසා මෙම ආචාරධර්ම පද්ධතිය තුළින් හඳුනාගන්නා කරුණු රටක දියුණු ප්‍රජාතන්ත්‍රවාදී ජීවගුණය පවත්වාගෙන යාම සඳහා මැතිවරණ කාලසීමාවෙන් ඔබ්බට ගොස් සුරක්ෂිත කිරීම සඳහා දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරන අපේක්ෂකයින් ලෙස ඔබ වෙත සුවිශේෂී වගකීමක් පැවරී ඇත. ශ්‍රී ලංකාව තුළ පවතින පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තුළ වසර 05 ක් සඳහා ජනතා නියෝජනය සඳහා එම ජනතා නියෝජනය වෙනුවෙන් නීති සම්පාදනය කිරීම සඳහා ඔබ ජනතා වරමක් අපේක්ෂාවෙන් ජනතාව වෙත යොමුවන මෙම මොහොතේ වඩාත් සාමකාමී, සුරක්ෂිත, සැමට සමාන ගරුත්වයෙන් යුතු ආරක්ෂිත සමාජ වටපිටාවක් ඇති කිරීමට මෙම ආචාරධර්ම අනුව කටයුතු කිරීම බෙහෙවින් උපකාර වනු ඇත.

ආචාර්ය දීපිකා උඩගම,
සභාපතිනිය,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2020 ජූලි මස 21